සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර I විභාගය - 2024 ජනවාරි

## (101) මූල්‍ය ගිණුම්කරණය

(Financial Accounting)

2024-02-17
සෙනසුරාදා
[09.00 – 12.00]

පිටු ගණන : 09
ප්‍රශ්න ගණන: 06

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 40)

### 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාළ අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.1 අතීත සිද්ධීන්වල ප්‍රතිඵලයක් ලෙස අස්තිත්වය විසින් පාලනය කරනු ලබන වර්තමාන ආර්ථික සම්පත් වන්නේ:

(1) ස්කන්ධයයි. (2) වගකීම් ය. (3) වත්කම් ය. (4) ආදායම් ය.

1.2 වර්ගය, ප්‍රමාණය, එකඟ වූ මිල, අවශ්‍ය දිනය සහ අනෙකුත් කොන්දේසි හා නියමයන් වැනි මිලදී ගැනීමට අවශ්‍ය වන භාණ්ඩවල විස්තර ඇතුළත් කර ගැනුම්කරුවෙකු විසින් පිළියෙළ කරනු ලබන නිවැරදි මූලාශ්‍ර ලියවිල්ල තෝරන්න:

(1) ගෙවීම් වවුචරය [Payment Voucher (PV)].

(2) ගැනුම් ඇණවුම [Purchase Order (PO)].

(3) භාණ්ඩ ලැබීම් පත්‍රය [Good Received Note (GRN)].

(4) ද්‍රව්‍ය අධියාචනා පත්‍රය [Material Requisition Note (MRN)].

1.3 පහත සඳහන් ඒවා අතුරෙන්, ව්‍යාපාරවල ගිණුම්කරණ හා ව්‍යාපාරික ක්‍රියාකාරකම් කෙරෙහි බලපෑ හැකි පෙස්ටල් (PESTEL) විශ්ලේෂණය අනුව ආර්ථික සාධකයක් තෝරන්න:

(1) 2007 අංක 07 දරණ සමාගම් පනත. (2) විනිමය අනුපාතය.

(3) ගනුදෙනුකරුවන්ගේ ආකල්ප. (4) ගිණුම්කරණ මෘදුකාංග භාවිතය.

1.4 **අරුණ ට්‍රේඩර්ස්** ව්‍යාපාරය පුළුල් කිරීම සඳහා රු.500,000/- ක බැංකු ණයක් ලබා ගන්නා ලදී පහත සඳහන් ඒවා අතුරෙන් මෙම ගනුදෙනුවෙන් ගිණුම්කරණ සමීකරණයට වන නිවැරදි බලපෑම තෝරන්න:

| | වත්කම් (රු.) | = | ප්‍රාග්ධනය (ස්කන්ධය) (රු.) | + වගකීම් (රු.) |
|---|---|---|---|---|
| (1) | + 500,000 | = | + 500,000 | - |
| (2) | - 500,000 | = | - | - 500,000 |
| (3) | + 500,000 | = | - | + 500,000 |
| (4) | - 500,000 | = | - 500,000 | - |

1.5 **සමන් ට්‍රේඩර්ස්** රු.2,500,000/- කට ඉඩමක් මිලදී ගත් අතර, ඉඩමේ වර්තමාන වෙළෙඳපොළ වටිනාකම රු.4,000,000/- කි. කෙසේවුවද, මෙම ඉඩම, මූල්‍ය ප්‍රකාශනවල ගැනුම් මිල වූ රු.2,500,000/- ක් ලෙස පෙන්වා තිබේ. මේ සම්බන්ධයෙන් අදාල වන ගිණුම්කරණ සංකල්පය වන්නේ:

(1) ගැලපුම් සංකල්පයයි.
(2) උපචිත සංකල්පයයි.
(3) අඛණ්ඩ පැවැත්ම සංකල්පයයි.
(4) ඓතිහාසික පිරිවැය සංකල්පයයි.

1.6 පහත සඳහන් ඒවා අතුරෙන්, වෙළෙඳ ණයගැතියෙකුගෙන් මුදල් ලැබීමක් හේතුවෙන් ගිණුම්කරණ මූලිකාංග මත වන නිවැරදි බලපෑම තෝරන්න:

(1) වත්කම් වැඩිවීම සහ වගකීම් වැඩිවීම.
(2) වත්කම් වැඩිවීම සහ ස්කන්ධය වැඩිවීම.
(3) වත්කම් අඩුවීම සහ ස්කන්ධය අඩුවීම.
(4) වත්කම්වල වෙනස්වීමක් සිදු නොවේ.

1.7 2023 දෙසැම්බර් 31 දිනට බැංකු ප්‍රකාශනයේ රු.65,000/- ක වාසිදායක ශේෂයක් තිබූ අතර, එය එම දිනට මුදල් පොතේ ශේෂයට වඩා රු.5,000/- කින් අඩු විය. පහත සඳහන් ඒවා අතුරෙන්, වෙනස සඳහා වන හේතුව තෝරන්න:

(1) රු.2,500/- ක බැංකු ගාස්තු, මුදල් පොතේ වාර්තා කර නොතිබීම.

(2) නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් කර නොමැති චෙක්පත්වල වටිනාකම රු.5,000/- කි.

(3) තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත්වල වටිනාකම රු.5,000/- කි.

(4) ගනුදෙනුකරුවෙකු විසින් සිදුකළ රු.5,000/- ක ඍජු තැන්පතුව, මුදල් පොතේ වාර්තා කර නොතිබීම.

1.8 පහත සඳහන් තොරතුරු, **සමීර ට්‍රේඩර්ස්හි** පොත්වලින් 2024 ජනවාරි මාසය සඳහා උපුටාගන්නා ලදී:

| | රු. |
|---|---|
| 2024 ජනවාරි 31 දිනට ශුද්ධ වත්කම් | 4,500,000 |
| 2024 ජනවාරි 01 දිනට ශුද්ධ වත්කම් | 3,700,000 |
| මාසය තුළදී සිදු කළ ගැනිලි | 200,000 |
| මාසය තුළදී හඳුන්වා දුන් අමතර ප්‍රග්ධනය | 300,000 |

ඉහත සඳහන් තොරතුරු මත පදනම්ව, 2024 ජනවාරි 31 දිනෙන් අවසන් වූ මාසය සඳහා ව්‍යාපාරයේ ලාභය වයෙ:

(1) රු.700,000/-. (2) රු.800,000/-. (3) රු.900,000/-. (4) රු.1,100,000/-.

1.9 පහත සඳහන් ඒවා අතුරෙන්, බැංකු ප්‍රකාශනයේ ශේෂය සහ මුදල් පාලන ගිණුමේ ශේෂය අතර වෙනස සඳහා හේතුවක් විය හැකි කාල වෙනසක් වන්නේ කුමක් ද?

(1) ගනුදෙනුකරුවන්ගෙන ලද සෘජු ප්‍රේෂණ. (2) තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත්.

(3) බැංකුව විසින් හර කරනු ලැබූ බැංකු ගාස්තු. (4) බැංකුව විසින් වැරදීමෙන් හර කළ අයිරා පොලිය.

1.10 **සීමාසහිත ABC සමාගමේ** ගොඩනැගිල්ලේ කොටසක් මසකට රු.10,000/- බැගින් කුලියට දී තිබේ. 2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළදී රු.110,000/- ක මුදලක් ලැබුණු අතර, ඉතිරි රු.10,000/- ඊළඟ මූල්‍ය වර්ෂය තුළදී ලැබුණි. සමාගමේ සහකාර ගණකාධිකාරීවරයා වන **විශ්ණු**, 2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන කුලී ආදායම වශයෙන් රු.110,000/- ක් පමණක් හඳුනාගෙන තිබුණි.

පහත සඳහන් ගිණුම්කරණ සංකල්ප අතුරෙන්, **විශ්ණු** විසින් උල්ලංඝණය කර තිබෙන්නේ කුමන ගිණුම්කරණ සංකල්පයද?

(1) ගැලපුම් සංකල්පය. (2) අස්තිත්ව සංකල්පය.

(3) උපචිත සංකල්පය. (4) ප්‍රමාණාත්මකබවේ සංකල්පය.

*අංක **1.11** සිට **1.15** දක්වා ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය **සත්‍ය** හෝ **අසත්‍යදැයි** දක්වන්න. **සත්‍ය** හෝ **අසත්‍ය** යන උත්තරය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.11 අස්තිත්වයේ හිමිකරුවන්ට කරන බෙදාහැරීම් හැර ස්කන්ධයේ අඩුවීමකට හේතුවන වත්කම්වල අඩුවීමක් හෝ වගකීම්වල වැඩිවීමක්, වියදමක් ලෙස නිර්වචනය කළ හැකය.

1.12 ක්වික්බුක් [QuickBooks (QB)] ගිණුම්කරණ පැකේජය, විශේෂිත ගිණුම්කරණ මෘදුකාංගයක් ලෙස වර්ග කළ හැකිය.

1.13 විකුණුම් දෛනික පොත, ගිණුම්කරණ ක්‍රියාවලියේදී ගිණුම්කරණ යෙදවුමකි.

1.14 අරමුණුගත බව (Objectivity) යනු ගිණුම්කරණ ශිල්පියෙකු විසින් අනුගත වියයුතු වෘත්තීය ආචාරධර්ම මූලධර්මයකි.

1.15 කරණ දෝෂ / ඌනතා දෝෂ (errors of commission) යනු ගනුදෙනුවක් සම්පූර්ණයෙන් වාර්තා නොකිරීම හෝ ද්විත්ව සටහනේ එක් සටහනක් පමණක් වාර්තා කිරීමයි.

*අංක **1.16** සිට **1.20** දක්වා ඇති ප්‍රශ්නවලට උත්තර, ප්‍රශ්න අංක ද සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.16 පහත සඳහන් ගනුදෙනු සඳහා භාවිත කරන මූලාශ්‍ර ලියවිල්ල හඳුනා දක්වන්න:

(1) කාර්යාලයේ භාවිතය සඳහා රු.200,000/- කට පරිගණකයක් ණයට මිලදී ගැනීම.

(2) **සීමාසහිත ABC සමාගමට** රු.600,000/- ක භාණ්ඩ ණයට විකිණීම.

1.17 **කමල් ට්‍රේඩර්ස්,** 2022 අප්‍රේල් 01 දින රු.6,000,000/- කට යන්ත්‍රයක් අත්පත් කරගන්නා ලදි. ප්‍රයෝජනවත් ආයු කාලය අවසානයේදී එහි සුන්බුන් අගය රු.1,000,000/- ක් වන අතර, යන්ත්‍රයේ ප්‍රයෝජනවත් ආයු කාලය වසර 5 කි. ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වන්නේ ප්‍රයෝජනවත් ආයු කාලය පුරා සරල මාර්ග ක්‍රමයට (වර්ෂයකට 20% බැගින්) යන්ත්‍රය ක්ෂය කිරීමයි. 2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා යන්ත්‍රයේ ක්ෂය ගණනය කරන්න.

1.18 ජංගම නොවන වත්කම් ලෙස වර්ග කළ හැකි වත්කම් සඳහා උදාහරණ දෙකක්(02) ලැයිස්තුගත කරන්න.

1.19 මූල්‍ය තොරතුරුවල සීමාවන් (limitations) දෙකක්(02) සඳහන් කරන්න.

1.20 "ගැලපුම් සංකල්පය" කෙටියෙන් පැහැදිලි කරන්න. (එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 40)

*A කොටසෙහි අවසානය*

# B කොටස

(මුළු ලකුණු 40)

## 02 වන ප්‍රශ්නය

**නසීර් මැෂින් වර්ක්ස්,** යන්ත්‍ර කොටස් නිෂ්පාදකයෙකු වන අතර, පහත සඳහන් තොරතුරු 2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **නසීර් මැෂින් වර්ක්ස්** හි ගිණුම් පොත්වලින් උපුටාගන්නා ලදි:

| විස්තරය | රු. |
|---|---|
| 2022 අප්‍රේල් 01 දිනට අමුද්‍රව්‍ය තොගය | 850,000 |
| අමුද්‍රව්‍ය මිලට ගැනුම් | 3,500,000 |
| 2022 අප්‍රේල් 01 දිනට නොනිමි වැඩ (ප්‍රාථමික පිරිවැයට අගය කරන ලද) | 225,000 |
| අමුද්‍රව්‍ය ගෙන ඒමේ කුළී | 75,000 |
| සෘජු වේතන – නිෂ්පාදන කම්කරුවන්ට | 1,500,000 |
| ආරක්ෂක ගාස්තු | 500,000 |
| විදුලි වියදම් | 520,000 |
| කර්මාන්තශාලා කළමනාකරුගේ වැටුප | 370,000 |
| පිරියත සහ යන්ත්‍ර මත ක්ෂය | 320,000 |
| මෝටර් ලොරි රථය මත ක්ෂය | 560,000 |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2023 මාර්තු 31 දිනට පැවති අවසන් තොග පහත පරිදි අගය කරන ලදි:

| විස්තරය | රු. |
|---|---|
| අමුද්‍රව්‍ය තොගය (පිරිවැයට) | 250,000 |
| නොනිමි වැඩ (ප්‍රාථමික පිරිවැයට අගය කර ඇත) | 425,000 |

(2) පහත සඳහන් වියදම්, පහත දක්වා ඇති පරිදි බෙදා වෙන් කරනු ලැබේ:

| වියදම් | කර්මාන්තශාලාව | කාර්යාලය |
|---|---|---|
| විදුලි වියදම් | 85% | 15% |
| ආරක්ෂක ගාස්තු | 90% | 10% |

(3) පිරියත හා යන්ත්‍ර සහ මෝටර් ලොරි රථය සම්පූර්ණයෙන්ම කර්මාන්තශාලාවේ කටයුතු සඳහා භාවිත කරයි.

(4) සෘජු වේතනවලට අමතරව, නිෂ්පාදනය කරන සෑම යන්ත්‍ර කොටසකටම රු.100/- බැගින් වූ දිරි දීමනාවකට නිෂ්පාදන කම්කරුවන් සුදුසුකම් ලබයි. වර්ෂය තුළදී යන්ත්‍ර කොටස් 10,000 ක් නිෂ්පාදනය කර තිබේ.

(5) නිෂ්පාදනය කරන ලද ඒකක, නිෂ්පාදන පිරිවැය මත 20% ක ලාභාන්තිකයක් සහිතව වෙළෙඳ අංශයට මාරු කරනු ලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා, **නසීර් මැෂින් වර්ක්ස්** හි නිෂ්පාදන පිරිවැය ලේඛණය (නිෂ්පාදන ගිණුම) **පිළියෙල කරන්න.** (ලකුණු 10)

## 03 වන ප්‍රශ්නය

**රවී** විසින් 2022 අප්‍රේල් 01 දින ආරම්භක ප්‍රාග්ධනය වශයෙන් මුදලින් රු.4,850,000/- ක් ආයෝජනය කරමින් **රවී සුපර්** නමින් කෝවලස්වාමි ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී.

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් පාලන ගිණුමේ (මුදල් පොත) සාරාංශය පහත දැක්වේ:

**මුදල් පාලන ගිණුම (මුදල් පොත)**

| ලැබීම් | හර (රු.) | ගෙවීම් | බැර (රු.) |
|---|---|---|---|
| ආරම්භක ප්‍රාග්ධන ආයෝජනය | 4,850,000 | අත්පිට ගැනුම් | 1,850,000 |
| අත්පිට විකුණුම් | 3,200,000 | වෙළෙඳ ණයහිමියන්ට ගෙවීම් | 2,900,000 |
| වෙළෙඳ ණයගැතියන්ගෙන් ලැබීම් | 2,825,000 | විදුලිය හා ජලය | 255,000 |
| | | වැටුප් හා වේතන | 1,200,000 |
| | | සුළු මුදල් පොතට මාරු කළ මුදල | 100,000 |
| | | බෙදාහැරීමේ වෑන් රථය<br>(2022 ඔක්තෝම්බර් 01 දින මිලදී ගන්නා ලදී) | 3,000,000 |
| | | ශේෂය ප/ගෙ | 1,570,000 |
| | **10,875,000** | | **10,875,000** |

(2) 2023 මාර්තු 31 දිනට ලැබිය යුතු සහ ගෙවිය යුතු ශේෂයන් පහත දැක්වේ:

| | රු. |
|---|---|
| වෙළෙඳ ණයගැතියන් | 2,400,000 |
| වෙළෙඳ ණයහිමියන් | 2,100,000 |
| ගෙවිය යුතු විදුලිය හා ජල බිල්පත් | 10,000 |

(3) මෝටර් වාහන, සරල මාර්ග ක්‍රමයට, පිරිවැය මත වාර්ෂිකව 25% බැගින් ක්ෂය කළ යුතුය.

(4) පහත සඳහන් වියදම්, සුළු මුදල් මඟින් ගෙවා තිබේ:

(i) කාර්යාල වියදම් : රු.15,000/-.

(ii) ගමන් වියදම් : රු.12,000/-.

(iii) මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය : රු.25,000/-.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2023 මාර්තු 31 දිනට **රවී සුපර්** හි **ශේෂ පිරික්සුම පිළියෙළ කරන්න.** (ලකුණු 10)

## 04 වන ප්‍රශ්නය

**බිමල් ට්‍රේඩර්ස්** හි ගිණුම් සහායක විසින් 2023 මාර්තු 31 දිනට පිළියෙළ කරන ලද ශේෂ පිරික්සුම එකඟ නොවිය. වෙනස වූ රු.279,500/-, අවිනිශ්චිත ගිණුමකට බැර කර, කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කරන ලදී. **බිමල් ට්‍රේඩර්ස්** වෙළෙඳ ලැබිය යුතු මුදල් හා වෙළෙඳ ගෙවිය යුතු මුදල් සඳහා පාලන ගිණුම් පවත්වාගෙන යයි.

වෙනස සඳහා පහත සඳහන් හේතු පසුව හඳුනාගන්නා ලදී:

(1) 2023 මාර්තු මාසය සඳහා ගෙවිය යුතු ආරක්ෂක ගාස්තුව වූ රු.35,000/- ක් ලෙජර් ගිණුම් දෙකෙහිම දෙවරක් සටහන් කර තිබුණි.

(2) ස්ථාවර තැන්පතුවක් මත ලැබුණු රු.2,750/- ක පොළ ආදායම, වැරදීමකින් පොළ වියදම් ගිණුමට හර කර තිබූ අතර, එය නිවැරදිව මුදල් පොතේ සටහන් කර තිබුණි.

(3) දෛනික ගැනුම් පොතේ එකතුව රු.20,000/- ක් වැඩියෙන් සටහන් කර තිබුණි.

(4) රු.250,000/- කට කාර්යාල උපකරණයක් මිලට ගැනීම, කාර්යාල වියදම් ගිණුමට හර කර තිබූ අතර, අනෙක් සටහන ගිණුම් පොත්වල නිවැරදිව සටහන් කර තිබුණි. වර්ෂය සඳහා මෙම කාර්යාල උපකරණය මත ක්ෂය රු.50,000/- කි.

(5) රු.265,000/- ක අත්පිට විකුණුම්, මුදල් පොතේ පමණක් සටහන් කර තිබූ අතර, අනෙක් සටහන අදාල ලෙජර් ගිණුමේ සටහන් කර නොතිබුණි.

(6) රු.67,000/- ක දුරකතන වියදම්, රු.76,000/- ක් ලෙස දුරකතන වියදම් ගිණුමේ සටහන් කර තිබුණි. නමුත් එය නිවැරදිව මුදල් පොතේ සටහන් කර තිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **පිළියෙළ කරන්න**:

(a) ඉහත සඳහන් වැරදි නිවැරදි කිරීමට අවශ්‍ය ජර්නල් සටහන්. (ලකුණු 07)

(b) අවිනිශ්චිත ගිණුම. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## 05 වන ප්‍රශ්නය

(A) **දුනිත්**, 2023 දෙසැම්බර් 01 දින අවන්හලක් ආරම්භ කළේය. 2023 දෙසැම්බර් මාසය තුළදී **දුනිත්ගේ** ව්‍යාපාරයේ පහත සඳහන් ගනුදෙනු සිදුවිය:

(1) **දුනිත්**, රු.2,000,000/- ක ආරම්භක ප්‍රාග්ධනයක් යෙදවූ අතර, එය මුදලින් රු.1,200,000/- ක් සහ රු.800,000/- ක් වටිනා කාර්යාල උපකරණවලින් සමන්විත විය.

(2) නැවත විකිණීම සඳහා රු.650,000/- ක් වටිනා භාණ්ඩ ණයට මිලදී ගන්නා ලදී.

(3) රු.260,000/- ක් පිරිවැය වූ පේස්ට්‍රි අයිතම, රු.350,000/- කට අත්පිට මුදලට විකුණන ලදී.

(4) මාසය සඳහා **දුනිත්** විසින් සිදුකළ මුදල් ගැනිලි රු.250,000/- කි.

(5) මාසයේ සේවක වැටුප් ලෙස රු.200,000/- ක් ගෙවන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ඉහත සඳහන් එක් එක් ගනුදෙනුව මඟින් පහත දැක්වෙන ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම **සඳහන් කරන්න**.

*[කාර්යාල උපකරණ + තොගය + මුදල් = ස්කන්ධය (ප්‍රාග්ධනය) + වගකීම්]* (ලකුණු 05)

(B) 2023 දෙසැම්බර් 31 දිනට, **නිමල් හාඩ්වෙයාර්** හි බැංකු ප්‍රකාශනය අනුව රු.277,500/- ක වාසිදායක ශේෂයක් විය. එදිනට මුදල් පාලන ගිණුම ද රු.225,000/- ක හර (වාසිදායක) ශේෂයක් පෙන්වයි.

බැංකු ප්‍රකාශනයේ ශේෂය සහ මුදල් පාලන ගිණුමේ ශේෂය අතර වෙනස සඳහා පහත සඳහන් හේතු හඳුනාගන්නා ලදී:

(1) ස්ථාවර නියෝග උපදෙස් අනුව, මාසික කුලිය සඳහා රු.55,000/- ක් බැංකුව විසින් හර කර තිබූ අතර, එය මුදල් පොතේ සටහන් කර නොතිබුණි.

(2) 2023 දෙසැම්බර් 30 දින නිකුත් කළ රු.128,000/- ක චෙක්පතක්, 2023 දෙසැම්බර් 31 දින වනතුරු ගෙවීම සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(3) බැංකුව විසින් 2023 දෙසැම්බර් 15 දින හර කරන ලද රු.5,000/- ක බැංකු ගාස්තු, මුදල් පොතේ සටහන් කර නොතිබුණි.

(4) පසුගිය මාසයේදී වැඩිපුර අයකරන ලද රු.12,500/- ක අයිරා පොලිය, 2023 දෙසැම්බර් 31 දින බැංකුව විසින් බැර කර තිබෙන අතර, එය මුදල් පොතේ සටහන් කර නොතිබුණි.

(5) රු.28,000/- ක චෙක්පතක්, බැංකු ගිණුමට තැන්පත් කළද, එය 2023 දෙසැම්බර් 31 දින වන විටත් උපලබ්ධි වී නොතිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ පිළියෙළ කරන්න:

(a) ගලපන ලද මුදල් පාලන ගිණුම (මුදල් පොත). (ලකුණු 03)

(b) 2023 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශනය. (ලකුණු 02)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 20)

### 06 වන ප්‍රශ්නය

**නිහාල් ඉලෙක්ට්‍රිකල්ස්, නිහාල්** ට අයිතිව ඇති කේවලස්වාමි ව්‍යාපාරයකි. 2023 මාර්තු 31 දිනට **නිහාල් ඉලෙක්ට්‍රිකල්ස්** හි ශේෂ පිරික්සුම පහත දැක්වේ:

**නිහාල් ඉලෙක්ට්‍රිකල්ස්**

**2023 මාර්තු 31 දිනට ශේෂ පිරික්සම** *(රු.'000)*

| විස්තරය | හර | බැර |
|---|---|---|
| පිරියත සහ උපකරණ - පිරිවැයට: | | |
| පිරියත සහ යන්ත්‍ර | 7,000 | |
| ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | 4,000 | |
| කාර්යාල උපකරණ | 1,000 | |
| 2022 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය: | | |
| පිරියත සහ යන්ත්‍ර | | 2,200 |
| ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | | 600 |
| විකුණුම් | | 62,900 |
| ගැනුම් | 38,000 | |
| ප්‍රවාහන වියදම් | 900 | |
| 2022 අප්‍රේල් 01 දිනට තොගය | 2,800 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 9,500 | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | | 15,900 |
| බැංකුවේ ඇති මුදල් | 3,500 | |
| අතැති මුදල් | 460 | |
| බැංකු ණය | | 1,000 |
| ජලය | 2,500 | |
| වැටුප් සහ වේතන | 11,000 | |
| රක්ෂණය | 260 | |
| විදුලිය | 7,850 | |
| දුරකතන ගාස්තු | 350 | |
| කාර්යාල කුලිය | 2,200 | |
| බැංකු ගාස්තු | 40 | |
| 2022 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධන ගිණුම | | 8,760 |
| **එකතුව** | **91,360** | **91,360** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2023 මාර්තු 31 දිනට අවසාන තොගය, රු.9,270,000/- ක පිරිවැයට අගය කරන ලදී.

(2) 2022 ඔක්තෝම්බර් 01 දින, රු.1,000,000/- ක බැංකු ණයක් වාර්ෂිකව 20% ක පොළී අනුපාතයක් යටතේ ලබාගන්නා ලදී. එදිනම, එම බැංකු ණය මුදල භාවිතයෙන් රු.1,000,000/- ක කාර්යාල උපකරණ මිලදී ගන්නා ලදී. ණය මුදලේ ප්‍රාග්ධන ආපසු ගෙවීම 2023 අප්‍රේල් 01 දින ආරම්භ කළ අතර, වර්ෂය සඳහා වන පොලිය ගිණුම් පොත්වල ගිණුම්ගත කර නොමැත.

(3) ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වන්නේ පහත පරිදි, පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය සඳහා ප්‍රතිපාදනය කිරීමයි:

| | | |
|---|---|---|
| පිරියත සහ යන්ත්‍ර | : | වර්ෂයකට 20% බැගින් |
| ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | : | වර්ෂයකට 20% බැගින් |
| කාර්යාල උපකරණ | : | වර්ෂයකට 15% බැගින් |

(4) රු.260,000/- ක ව රක්ෂණය, 2023 ජනවාරි 01 දින සිට 2023 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදයට අදාළ වේ.

(5) **සිල්වාගෙන්** ලැබිය යුතු රු.50,000/- ක් බොල්ණයක් ලෙස ලියාහැරීමට **තිහාල්** තීරණය කර තිබේ.

(6) 2023 මාර්තු මාසය සඳහා පහත වියදම්, ගිණුම් පොත්වල උපචිත (ගෙවිය යුතු) ලෙස සටහන් කර නොතිබුණි:

- කුලිය : රු.200,000/-
- විදුලිය : රු.135,000/-

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) 2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය. (ලකුණු 11)

(b) 2023 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 09)

(මුළු ලකුණු 20)

*C කොටසෙහි අවසානය*

# <u>කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව</u>

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | අඳින්න | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | සඳහන් කරන්න | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | හඳුනා දක්වන්න | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | හඳුනාගන්න | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | අර්ථකතනය කරන්න | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | විස්තර කරන්න | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | පැහැදිලි කරන්න | අදාළ කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැළපීම. | සසඳන්න | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | ප්‍රස්තාර දක්වන්න | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | විසඳන්න | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | පිළියෙල කරන්න | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | ප්‍රදර්ශනය කරන්න | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | භාවිත කරන්න | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | සන්නිවේදනය කරන්න | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | සමානකම් බලන්න | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | විමසන්න | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |